# නිවේදනයයි

## 2017/2018 අධ්‍යයන වර්ෂයට අයත් (ප්‍රථම වසර) සිසුන් සඳහා මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව පිරිනැමීම

2017/2018 අධ්‍යයන වර්ෂයට ප්‍රවේශිත ප්‍රථම වසර සිසුන් අතුරින් මහපොළ ශිෂ්‍යත්වය සඳහා සුදුසුකම් ලබා ඇති සිසුන්ගේ නාම ලේඛනය මහපොළ ශිෂ්‍යත්ව අංකය සහිතව විශ්වවිද්‍යාල වෙබ් අඩවියෙහි පළකර ඇත. එහි මහපොළ ශිෂ්‍යත්වය හිමි සිසුන් 2019.06.07 දිනට පෙර **ඕනෑම මහජන බැංකු ශාඛාවක ඔබ නමින් ගිණුමක් විවෘත කර** එම බැංකු ගිණුම් විස්තර දැන්වීම සඳහා "www.mahapola.lk" වෙබ් අඩවියට පිවිස එහි mahapola scholarship මගින් තම මහපොළ ශිෂ්‍යත්ව අංකය හා ජාතික හැඳුනුම්පත් අංකය භාවිත කර අදාළ ආකෘති පත්‍රය ලබාගෙන තම **බැංකු ගිණුම් විස්තර ඇතුලත් කර මහපොළ භාරකාර අරමුදල වෙත** (On line) **මගින් යොමු කළ යුතුය.**

තවද ඒ සමගම තම ශිෂ්‍ය හැඳුනුම්පත හා **බැංකු ගිණුම් පොතෙහි සහතික කරන ලද ඡායා පිටපතක්** රැගෙන පැමිණ **මහපොළ ශිෂ්‍යත්ව අංකය දැනුම් දී** ශිෂ්‍යසේවා අංශය මගින් නිකුත් කරනු ලබන මහපොළ ආකෘති පත්‍රය ලබාගෙන එහි ද බැංකු ගිණුම් තොරතුරු සම්පූර්ණකර බැංකු පොතෙහි ඡායා පිටපත සමග බාර දී **ශිෂ්‍යත්ව ප්‍රදාන ලිපිය හා මහපොළ ශිෂ්‍යත්ව සහතිකය** බාරගන්නා ලෙස දන්වා සිටිමි. තවද **මහපොළ ශිෂ්‍යත්වය බාර නොගන්නා සිසුන්ගේ ශිෂ්‍යත්වය අවලංගුවන බව** මෙයින් වැඩි දුරටත් දන්වා සිටිමි.

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී/ශිෂ්‍යසේවා,

2019.05.27